# ඉන්දියාව හා ලංකාව

කොටි පැරදවීමට අපට ඉන්දියාවෙන් සහායක් නොලැබෙන බව මේ වන විට ද තේරුම්ගත නොහැකි අය සිටිය හැකි ය. වසර පන්සියක කාලයක් යුරෝපීය ආශ්‍රයෙන් හා ඉන් වසර දෙසියක පමණ කාලයක් බ්‍රිතානි ඇසුරෙන් පසුව බ්‍රිතානීන්ගෙන් මානසික ව නිදහස්වීමට නොහැකි පිරිස් සිටින විට අවුරුදු දෙදහස් ගණනක භාරතීය ආශ්‍රයකින් පසුව භාරතයෙන් මානසික ව නිදහස්වීමට නොහැකි අය සිටීම පුදුමයක් නො වෙයි. අපේ ඉතිහාසය ලියා ඇත්තේ එක්කෝ භාරතය උසස් ලෙස සලකමිනි. එසේත් නැත්නම් බ්‍රිතානිය ඉහළට ඔසවමිනි. ඉතිහාසය ද සාපේක්ෂ දැනුම් පද්ධතියකි. භෞතික විද්‍යාව හා ගණිතය සාපේක්ෂ දැනුම් පද්ධති වන විට ඉතිහාසය ද එසේ වීම පුදුමයට කරුණක් නො වෙයි. අප පළමුවෙන් ම අපට සාපේක්ෂ ඉතිහාසයක් ලිවිය යුතු ය. එනම් සිංහලයන්ට සාපේක්ෂ ඉතිහාසයක් අපට තිබිය යුතු ය.

සාපේක්ෂ ඉතිහාසයක් යනු අපට කැමති ආකාරයකට නිර්මාණය කරන ඉතිහාසයක් නො වෙයි. සාධක යනු ද ප්‍රවාදයකින් ස්වායත්ත වූ තොරතුරු රාශියක් නො වෙයි. සාධක ප්‍රවාද මත පරායත්ත වෙයි. අප මේ ප්‍රවාද ඒ මත පදනම්වන සාධක ආදී සියල්ල එකතුකර සංගත ඉතිහාසයක් ගොඩනැගිය යුතු ය. ඒ ඉතිහාසයෙහි සමස්තයක් ලෙස ගත්කල විසංවාද තිබිය හැක්කේ ඉතාම අවම වශයෙනි. විසංවාද කිසිවක් නැති ඉතිහාසයක් ලොවේ කොතැනකවත් ඇතැයි සිතිය නො හැකි ය.

අප බොහෝ විට කියා ඇත්තේ ඉන්දියාව කොටි පැරදවීමට අපට යම් දිනක උපකාරී වුවහොත් එසේ කරන්නේ උතුරු හා නැගෙනහිර පළාත් ලංකාවට අහිමිකරන සන්ධීය විසඳුමක් බලහාත්කාරයෙන් හෝ ලබාගැනීමෙන් පසුව බව ය. අද ඊපීආර්එල්එෆ් - පද්මනාභන් පිළේ විසඳුම ඉදිරිපත්වී ඇත්තේ  ඉන්දියාවේ අවශ්‍යතාවට ය. ඉන්දියාව කොටින්ට විරුද්ධ ය. එහෙත් එරට සිංහලයන්ට එයටත් වඩා විරුද්ධ ය. එය අද ඊයේ කතාවක් නොව භාරතයෙන් බුදුදහම අතුගෑවී ගිය කාලයේ සිට පැවතෙන විරුද්ධත්වයකි.

ඉන්දියාව යන රට යුරෝපීයයන්ගේ නිර්මාණයක් නම් භාරතය වෛදිකයන්ගේ නිර්මාණයක් විය. වෙනත් වචනවලින් කියන්නේ නම් වෛදිකයන් භාරතයට පැමිණීමට පෙර භාරතයක් නො වි ය. සමහර විට අප එරට හැඳින්විය යුත්තේ ජම්බුද්වීපය හෙවත් දඹදිව යනුවෙන් විය හැකි ය. එහෙත් ඒ පිළිබඳ නිශ්චිත මතයක් ප්‍රකාශකිරීමට දැනට අපොහොසත් වෙමි. කෙසේ වෙතත් දඹදිව හෝ භාරතය හෝ තනි රටක් රාජ්‍යයක් ලෙස පැවතී නැත. අප දන්නා බෞද්ධ ඉතිහාසය අනුව එහි මගධ, කෝසල, ලිච්ඡවි ආදී රාජධානි තිබී ඇත. අශෝක රාජ්‍යය පවා මු මහත් භාරතය හෝ ඉන්දියාව හෝ පුරා පැතිරී නොතිබිණි. මේ රාජ්‍ය, වංශවල රාජ්‍ය මිස ජාතියක හෝ ගෝත්‍රයක හෝ ජනවර්ගයක හෝ රාජ්‍ය නො වී ය. භාරතයේ කිසි දිනෙක දෙමළ හෝ වෙනත් ජනවර්ගයක හෝ රාජ්‍යයක් තිබී නැත. චෝල, පාන්ඩ්‍ය, චේර, පල්ලව ආදී රාජ්‍ය මෙන් ම මෞර්ය රාජ්‍යය ද වාංශික රජ්‍ය පමණක් විය. ලංකාවේ ඒ එසේ නො වී ය. මෙහි සිංහල රාජ්‍යයක් ඇතිවිය. ඒ සිංහල රාජ්‍යයේ රජකම ඇතැම්විට ලම්බකර්ණ වංශයට අයත්විය. එසේ වුවත් ඒ රාජ්‍යය ලම්බකර්ණ රාජ්‍යයක් ලෙස නො හැඳින්විණි.  පසු කලෙක නුවර යුගයේ දී නායක්කාර් වාංශිකයන් ද රජකෙළේ සිංහල රාජයෙහි මිස නායක්කාර් රාජ්‍යයක නො වෙයි. බ්‍රිතානිය පැත්තෙන් පමණක් සිතන්නට පුරුදු වූවකුට අවශ්‍ය නම් මෙය ඉංගිරිසි රාජ්‍යය සමග සංසන්දනය කළ හැකි ය. එහි ටියුඩර් වාංශිකයන් රජකර ඇත. එහෙත් එය ටියුඩර් රාජ්‍යයක් නො වී ය. දහසයවැනි සියවසෙන් පසුව යුරෝපයේ ඇති වූ  රාජ්‍යවල ඇතැම් ලක්ෂණ පැරණි සිංහල රාජ්‍යයෙහි ද තිබීම ඇතැමුන්ට විඳ දරාගත නොහැකි වී ඇත. කෙසේ වෙතත් අපට මෙහි දී වැදගත්වන්නේ ඒ කරුණට වඩා වෙනත් එකකි.

භාරතය, භාරතය වීම ඇරඹුණේ එහි වයඹ හා බටහිර පෙදෙස්වලිනි. එයට හේතුව ආර්යයන් (මේ ගෝත්‍රයක් හෝ ජනවර්ගයක් හෝ නොවේ යැයි පඩිවදන් අවශ්‍ය නො වෙයි.) ඒ පෙදෙස්වලින් භාරතය යැයි පසුව හැඳින්වුණු ප්‍රදේශයට පැමිණීම ය.  එනමින් හැඳින්විය හැකි සංස්කෘතියක් බටහිරින් භාරතය යැයි හැඳින්වෙන ප්‍රදේශයට ඇතුළ් වූ බව පැහැදිලි ය. ආර්යයන් යනුවෙන් අප විසින් හැඳින්වෙන්නේ යම් සංස්කෘතියක් ඊනියා භාරතයට හඳුන්වාදුන් පිරිසකි. මොවුන් භාරතය යැයි කියන ප්‍රදේශයට පැමිණීමට පෙර එහි විසූ ජනයාට අපි අනාර්ය යැයි කියමු. අනාර්ය යනු ද්‍රවිඩ නොවන බව පමණක් මෙහි දී සඳහන් කළයුතු ය. ද්‍රවිඩ යන පිරිස භාරතයට පැමිණියේ බටහිර ආසියාවෙන්

© Prof. Nalin De Silva

ආර්යයන් පැමිණීමෙන් බොහෝ කලකට පසුව යැයි විශ්වාස කෙරෙයි. අනාර්ය ගණයාට යක්ෂ, නාග ආදී ගෝත්‍ර ඇතුළත් විය.

ආර්යයන් පැමිණීමට පෙර තිබූ සභ්‍යත්වය අපි අනාර්ය සභ්‍යත්වය ලෙස හඳුන්වමු. මේ සභ්‍යත්වය තිබුණේ පසුව භාරතය බවට පත්වූ ප්‍රදේශයෙහි පමණක් නො වෙයි. චීනයේ, මොංගෝලියාවේ මෙන් ම ලංකාවේ ද පැවතියේ ඒ අනාර්ය සභ්‍යත්වය ය. එහි විවිධ සංස්කෘතීන් නොතිබුණා නො වෙයි. ඒ අනාර්ය සභ්‍යත්වය අද ඇතැමුන් ද්‍රවිඩ සංස්කෘතියක් ලෙස හඳුනාගැනීමට උත්සාහකරන්නේ ඉන්දියාවේ ඉතිහාසය පසුකාලයක ද්‍රවිඩයන්ට පක්ෂව නිර්මාණය කිරීමට කටයුතු කළ බ්‍රිතාන්‍යීන් අනුකරණය කරමිනි. බ්‍රිතාන්‍යීන්ට එසේ කිරීමට අවශ්‍යතාවක් විය. ඒ ඔවුන් විසින් ම නිර්මාණය කර පාලනය කළ ඉන්දියාව (වත්මන් පකිස්තානය හා බංග්ලාදේශය ද ඇතුළු) ඔවුන්ගේ පාලනයෙන් ගිලිහී යැමේ දී දෙකඩ තෙකඩ කිරීම ය.

ආර්යයන් භාරතය යැයි හැඳින්වෙන ප්‍රදේශයට පැමිණීමෙන් පසුව සිදුවූයේ කුමක් ද ? අද ඉන්දියාවේ සිදුවන දෙය එදා භාරතයෙහි සිදුවිණි යැයි කීම අතිශයෝක්තියක් නො වෙයි. ආර්යයන් තම සංස්කෘතිය භාරතය පුරා ප්‍රචලිත කෙළේ යුද්ධ ශක්තිය උපයෝගී කරගනිමිනි. යුද්ධ ශක්තිය ආර්ථික ශක්තියෙන් ම ජනනය වන්නක් නො වෙයි. ලෝක ඉතිහාසයේ විකාශය ඊනියා ප්‍රයුක්තිය (ප්‍රැක්සිස්) ඔස්සේ හෝ ආර්ථක සම්බන්ධතාවන්ට ඌනනයකිරීමට උත්සාහකරන බංකොලොත් මාක්ස්වාදයට මෙය තේරුම් ගතහැකි නො වෙයි. අද ඇමරිකන් එක්සත් ජනපදයෙහි ආර්ථික ශක්තිය ලෝක ආර්ථික ශක්තියෙන් සියයට විස්සක් පමණ යැයි කියැවෙයි. එහෙත් එහි යුද්ධ ශක්තිය ලෝක යුද්ධ ශක්තියෙන් සියයට පණහක් පමණ වෙයි. භාරතයට පැමිණි ආර්යයෝ ද යුද්ධ ශක්තියක් ඇති අය වූහ. ඔවුන් තම සංස්කෘතිය භාරතය පුරා ප්‍රචලිත කෙළේ අද ඇමරිකානුවන් තම යුද්ධ ශක්තිය යොදාගනිමින් ලෝකය පුරා තම සංස්කෘතිය ප්‍රචලිත කරන ආකාරයට ය. එදා මෙන් ම අද ද භාරතයෙහි (ඉන්දියාවෙහි) සිදුවන්නේ ආර්ථික ආක්‍රමණයකට වඩා සංස්කෘතික ආක්‍රමණයකි.

ආර්යයෝ භාරතයට පැමිණ තම සංස්කෘතිය අනාර්ය සංස්කෘතිය අභිබවා පැතිරවූහ. ඔවුහු ඇතැම් දේ අනාර්ය සංස්කෘතියෙන් ගත්හ. එසො ගැනීමෙන් වෛදික යැයි කිවහැකි වැඩි වශයෙන් ආර්ය වූ සංස්කෘතියක් නිර්මාණය කළහ. එය වයඹින් හා බටහිරින් භාරතයේ නැගෙනහිරට හා දකුණට ක්‍රමයෙන් පැතිරී ගියේ ය. එහෙත් ඒ සඳහා සෑහෙන කාලයක් ගතවිය. සිදුහත් කුමරු ඊසානදිග භාරතයෙහි ඉපදෙන කාලයේ දීත් භාරතයේ නැගෙනහිරින් සාංක්‍රමණිකයන් ලංකාවට පැමිනෙන කාලයේ දීත් වෛදික සංස්කෘතිය ඒ පෙදෙස්වල එතරම් තදින් පැතිර ගොස් නො තිබුණි. එපමණක් නො වෙයි. ඒ ප්‍රදේශවල වෛදික සංස්කෘතියට එරෙහි ප්‍රතික්‍රියාවක් පැතිරෙමින් තිබුණි. වෛදික යාග හෝම බලි බිලිවලට එරෙහිව විමුක්තිය සොයා ගිය ශ්‍රමණ සම්ප්‍රදායක් ඒ වන විට ඒ ප්‍රදේශවල තහවුරු වී තිබුණි. අසිත තවුසා, ආලාර කාළාම, උද්දකාරාම පුත්‍ර ආදීහු මේ සම්ප්‍රදායෙහි නායකයෝ වූහ. සිදුහත් කුමරු ගිහිගෙය අත්හැර යැමට පළමුව පැවිද්දකු දුටු බව කියැවෙයි. මේ පැවිද්දාගෙන් සංකේතවත් වන්නේත් සිදුහත් කුමරු අනුගමනය කළයුතු මග ලෙස දක්වනු ලැබුයේත් ශ්‍රමණ මග බව පැහැදිලි ය. සිදුහත් තවුසා ශ්‍රමණ සම්ප්‍රදායට අයත් විය. එතුමා බුද්ධත්වයට පත්වූයේ ශ්‍රමණ සම්ප්‍රදායෙහි ය. බුදුන්වහන්සේ වෛදික සංස්කෘතියට දැඩි ප්‍රහාරයක් එල්ල කළහ. ඒ සංස්කෘතික තලයෙහි බ්‍රාහ්මණයන්ට එරෙහිව පිළිබිඹුවීම පුදුමයක් නො වෙයි. බුදුන් වහන්සොගේ පිරිනිවන් පෑමෙන් ටික කලකට පසුව බුදු දහම භාරතය පුරා පමණක් නොව පැරණි අනාර්ය කලාපය පුරා පැතිරී ගියේ ය. එයට ප්‍රධාන හේතුව වූයේ බුදුදහම අනාර්ය සංස්කෘතියෙහි ජනිතවීම ය. බමුණන්ගේ ආර්ය සංකල්ප උඩු යටිකරමින් බුදුන්වහන්සේ ඒ සංකල්පවලට වෙනත් අර්ථකථන දුන්සේක. එහෙත් අනාර්ය සංස්කෘතියට තවදුරටත් බලවත්වීමට වෛදිකයෝ ඉඩ නොදුන්හ. එය සවිඥානික හා අවිඥානික ආකාරයෙන් සිදුවිණි. අවිඥානික ව ඒ සිදු වූයේ බුදු සසුනට එකතු වූ බමුණන් ඔස්සේ ය. බමුණු සංස්කෘතියෙන් ආශ්වාදය ලත් ඔවුහු බුදු දහම බුද්ධිවාදයක් බවට පත්කළහ. නාගර්ජුනපාදයන් වහන්සේ මෙහි දී අපට සිහිවෙයි. සවිඥානික ව බමුණෝ බුදුදහමේ සංකල්ප ද රැගත් හින්දු ආගමක් බිහිකළහ. සංකරාචාර්යයෝ එහි දී ප්‍රධාන වූහ. අනාර්ය සංකල්ප දැවටූ බමුණු දහමක් වූ හින්දු ආගම ඔස්සේ බුදු දහම භාරතයෙන් තුරන්කිරීමට බමුණෝ සමත්වූහ. භාරතයෙන් තුරන් වූ බුදු දහම රැකගැනීමට ඉදිරිපත්වූවෝ අනාර්ය සිංහලයෝ ය. භාරතීයයනට (ඉන්දියාවට) සිංහලයන් ගැන සුහද හැඟීමක් නැත.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva